**16-09-2020 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, සියලුම වේදනාවන් ඉවත් කර දමා සෑම දෙනාටම සතුට ලබාදීම සඳහා පියා පැමිණ සිටියි. සියලුම වේදනාවන් තොර කරවන්නා වන්නේ ඔබ නිසා. ඔබ කිසිම කෙනෙකුට වේදනාවක් නොදිය යුතුය.

**ප්‍රශ්නය:** උසස් තත්ත්වයක් ලබනා දරුවන්ගේ ලක්ෂණ මොනවාද?

**පිළිතුර:** 1. ඔවුන් සෑම විටම ශ්‍රීමත් අනුගමනය කරනවා.

**ගීතය:** ඔබ රාත්‍රිය නින්දෙනුත් දහවල කෑමෙනුත් අපතේ හැරියා...

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික දරුවන් ආධ්‍යාත්මික පියා ඉදිරියේ අසුන්ගෙන සිටියි. ඔබ හැර වෙන කිසිම කෙනෙකුට මෙම භාෂාව තේරුම් ගත නොහැක. කිසිම කෙනෙක් ආධ්‍යාත්මික දරුවන් කියා කියන්නේ නැහැ. එසේ කතා කරන්නේ කෙසේද යන්නවත් වෙන කිසිම කෙනෙක් දන්නේ නැහැ. කිසිම කෙනෙක් හරියටම හදුනන්නේ නැති ආධ්‍යාත්මික පියා ඉදිරියේ ඔබ දැන් හිදගෙන සිටිනවා. තමන් සහෝදර ජීවයන් බවත් සියලු දෙනාම ජීව බවත් පියා කියා හැඳින්වෙන්නේ එකම එක කෙනෙක් කියාත් ඔබ තේරුම් ගත්තත්, වෙන කිසිම කෙනෙක් මෙය තේරුම් ගන්නේ නැහැ. තමන් හරියට අවබෝධ කර ගන්නා මිසක් වෙන කොහොමද මෙය තේරම් කර ගන්නේ ඔබලා බ්‍රහමිණ්වරුන්. බ්‍රහ්මාගේ කටින් ඉපදුන ඔබලාගේ වාසකම වන්නේ බ්‍රහ්ම කුමාර හා කුමාරි යන්නයි. සියලු ජීව අයිති ශිවාටයි. ඔබට ශිව කුමාර හෝ කුමාරි කියන්නේ නැහැ. ඒ වචන වැරදියි. කුමාරයින් හා කුමාරියන් දෙගොල්ලම සිටිනවා. ජීව වශයෙන් ඔබ සියලු දෙනාම අයිති ශිවාටයි. මිනිස් දරුවන් බවට ඔබලා පත්වුණු විට බ්‍රහ්ම කුමාරයින් හා කුමරියන් වශයෙන් හැඳින්වෙනවා. ශිවාගේ දරුවන් සියලු දෙනාම අශාරිරික ජීවයනුයි. ජීව ලෝකයේ සිටින්නේ ජීව පමණයි. මෙහි පැමිණි විට ඔබලා බ්‍රහ්ම කුමර කුමරියන් බවට පත් වෙනවා. ඇත්තෙන්ම කියනවා නම් ඔබලා කුමාරයින්. ශිව බාබාගේ දරුවන් ඔබ ශරීරයකට ඇතුලු වුණු විට කුමාර හෝ කුමාරි තත්ත්වයට පත්වෙනවා. ඔබ බ්‍රහ්ම කුමාරයින් හා කුමරියන් වන නිසා තමයි සහෝදර සහොදරියන් කියාත් කියන්නෙ. ඔබ මෙම දැනුම ලබා ගන්නේ මේ කාලයේදීයි. බාබා අපව පිරිසිදු කරනවා ඔහුත් සමඟගෙන යන බව අපි දන්නවා. පියා සිහිපත් කරනා තරමට ජීව පාරිශුද්ධ වෙනවා. බ්‍රහ්මාගේ කටින් දුන් මෙම දැනුම ඔබ හදාරනවා. පියාගේ දැනුමත් පින්තූරවල පැහැදිලිව පෙන්නුම් කරනවා. ශිව බාබාම පැමිණ අපට උගන්වනවා. ක්‍රිෂ්ණා අපට උගන්වන්නේවත් පියාට ක්‍රිෂ්ණා හරහා අපට ඉගැන්වීමට හැකි වන්නේ නැහැ. ක්‍රිෂ්ණා යනු සත් යුගයේ කුමරයි. දරුවන් වන ඔබලාත් මෙය තේරුම් කර දිය යුතුයි. ක්‍රිෂ්ණා යනු සත් යුගයේ සිටිනා ඔබගේ දෙමාපියන්ගේ දරුවායි. සත් යුගයේ පියෙකුගේ දරුවෙක් සත් යුගයේ කුමරා. කිසිම කෙනෙක් මේ ගැන දන්නේ නැහැ. ක්‍රිෂ්ණාගේ උපන් දිනය දවසේදි ගෙවල් වලත්, කෝවිල් වලත් ඔහු වෙනුවෙන් ඔන්චිල්ලා සාදනවා. අම්මලාත් එහි ඇති කැටවලට සල්ලි දමා තම වන්දනා කටයුතු කරගෙන යනවා. මේ දවස් වල ක්‍රිස්තුන් වහන්සේවත් ක්‍රිෂ්ණාව පෙන්නනවා වගේම ඔහුටත් ඔටුණු පළදනවා වගේම උකුල මත තබාගෙන පෙන්වනවා. ක්‍රිෂ්ණා හා ක්‍රිස්තු නම් දෙකම එක වගේයි. ඒත් ඔවුන්ගේ උපත් වල ලොකු වෙනසක් තිබෙනවා. ක්‍රිස්තු නම් වු ජීවයේ උපත කුඩා දරුවෙක් ලෙසින් සිදුවන්නේ නැහැ. ක්‍රිස්තු ජීවය පැමිණ වෙනත් කෙනෙකුගේ ශරීරයට ඇතුලු වෙනවා. ඔහුට පාපයෙන් ඉපදෙන්න බැහැ. ඒ දවස්වල ක්‍රිස්තු තුමාව කවදාවත් කුඩා දරුවෙක් ලෙස පෙන්නුම් කළෙස් නැහැ. සෑම විටකම ඔහු පෙන්නුම් කළේ කුරුසයකයි. දැන් තමයි මිනිස්සු ඔහුව මේ ලෙසින් පෙන්වන්නේ. ධර්මයක් ස්ථාපනය කරනා කිසිම කෙනෙක් ඒ ලෙසින් මරා දැමිය නොහැකි බව ඔය දරුවන් වන ඔබලා දන්නවා. එසේ නම් ඔවුන්ව මරා දැමුවේ කවුරුන්වද? ඔහු ඇතුළු වුයේ කාගේ ශරීරයට ද ඒ පුද්ගලයාට වේදනාව විදිමට සිදුවුණා. සතෝප්‍රධාන් ජීවයක් වේදනා විදින්නේ කෙසේද? එතරම් වේදනාවක් විදිමට තරම් ඔහු කර ඇති කර්මය කුමක්ද? ජීව සතෝප්‍රධාන් (සම්පූර්ණ පාරිශුද්ධ) තත්ත්වයකින් පැමිණෙනවා. සෑම කෙනෙකුගේ ගිණුම් පියවිය යුතුයි. පියා දැන් සෑම කෙනෙක්වම පාරිශුද්ධත්වයට පත් කරවනවා. සම්පුර්ණයෙන් පාරිශුද්ධ ජීවයකට එහි සිට මෙහි පැමිණ වේදනා විදිමට සිදුවන්නේ ජීවයටයි. ජීව ඒ ඒ පුද්ගලයාගේ ශරීරයේ සිටිනවා විට තමයි වේදනාව හා දුක විදිමට සිදුවන්නේ. මට වේදනාවක් දැනෙනවා. කියා කිව්වේ කවුද? ශරීරය තුළ ජීවත්වෙන කෙනායි. සෑම කෙනෙක් තුළම උත්තරීතර ජීවයක් සිටිනවා කියා මිනිස්සු කියනවා. කෙහොම නමුත් මට වේදනාවක් දැනෙනවා කියා

ඔහුගෙන් කවදාවත් කියැවෙන්නේ නැහැ. උත්තරීතර ජීවය සෑම කෙනෙක් තුළම සිටිය හැක්කේ කෙසේද? උත්තරීතර ජීවය වේදනාව විදිය හැක්කේ කෙසේද? ජීව කනලව් කරනවා: අහෝ උත්තරීතර පියාණනි. උත්තරීතර ජීවයනි. අපගේ දුක නැති කර දමන්න. ජීව කනලව් කරන්නේ පාරලෞකික පියාටයි. පියා දැන් පැමිණ සිටිනා බවත් තම දුක් නැති කර ගැනිමේ මාර්ගයත් ඔහු දැන් ඔබට පෙන්වා දෙනවා. ජීව වන ඔබලා ශරීරයක් තුළම සිටිනා ගමන් නොනිමි සුවයක් හා ධනයක් ලබනවා. ජීව ලෝකයේදි ඔබලා නිරෝගි ධනවත් කෙනෙක් කියා කියන්නේ නැහැනේ. එහි කිසිම ලෝකයක් නැහැ. එහි ඇතතේ සාමය පමණයි. එහිදි ඔබලා සිටින්නේ ඔබගේ මුල්ම සනාතන ධර්මය සාමයේයි. පියා දැන් පැමිණ සිටින්නේ සෑම කෙනෙකුගේම වේදනාව නැති කර දමා ඔහුනට සතුට දීමටයි. ඒ නිසා ඔහු දරුවන්ට කියනවා: ඔබ දැන් මගේයි. එම නිසා කිසිම කෙනෙකුට රිදවන්න එපා. මෙය සටන් බිමක්. නමුත් එය පේන්නේ නැහැ. අනිත් සටන් බිම නම් පේනවා. මෙම සටන් බිමේදි මිය යන අය දෙව් ලොවට යනවා කියන කියමනේ අර්ථය ඔබ පැහැදිලි කර දිය යුතුයි. බලන්න මෙම සටන කෙතරම්ම වැදගත්ද කියලා. වෙන කිසිම සටන් බිමක දි මිය ගිය විට කිසිම කෙනෙක් දෙව් ලොව වෙත යන්නේ නැති දරුවන් වන ඔබලා දන්නවා. ගීතාවේ සඳහන් වි තිබෙනවා: දෙවියන්ව කතා කරයි. කියලා. ඔබ ඔහු විශ්වාස කරනවා නේද? ඔහු එසේ කීවේ ඒ සටනේ නිරත අයට ද නැති නම් ඔබලාටද? ඔහු එය කීවේ දෙගොල්ලටමයි. ඔවුන්ටත් කියනවා: තමා ජීවයක් බව සලකා පියා සිහිපත් කරන්න. සේවයත් කල යුතුයි. දෙව් ලොව වෙත යා යුතු නම් ඔබ උත්සහ දැරිය යුතුයි. යුද්ධයක සෑම ආගමක අය ඉන්නවා. සික්වරුන් පවා සිටිනවා. ඔවුන් සික් ධර්මයට යාවි. ඔවුනට දෙව් ලොව වෙත යා හැකි වන්නේ මෙහි පැමිණි බ්‍රහ්මින්වරු වන ඔබලාගෙන් දැනුම ලබා ගත හොත් පමණයි. ඔවුන් බාබා ලඟට පැමිණි විට යුද්ධ කරනා ගමන් ඔවුන් බාබා සිහිපත් කරමින් සිටිය හොත් දෙව් ලොව වෙත යා හැකි යැයි කියා බාබා පැහැදිලි කර දෙනවා. කොහොම නමුත් ඔවුන් දෙව්ලොව රජ කෙනෙක් වෙන්නේ නම් නැහැ. එතරම් ලොකු දෙයක් ඔවුන්ට පැහැදිලි කර කියා දෙන්න බැහැ. පැහැදිලි කර කියා දිය හැක්කේ දැනුමින් ඉතාමත් සුළු කොටසක් පමණයි. සටන් බිමේ සිටිනා විට අනිවාර්යයෙන්ම ඔවුන් තම තමන් විශ්වාස කරනා දේවතාවරුන් සිහිපත් කරනවා. කෙනෙක් සික් ජාතිකයෙක් නම් ඔහු කියාවි: ගුරු ගොවින්දට ජය වේවා. කිසිම කෙනෙක් තමන් ජීවයක් වශයෙන් සලකමින් උත්තරීතර ජීවය සිහිපත් කරන්නේ නැහැ. කොහොම නමුත් පියාගේ හැඳන්වීම ලබා ගනනා අය දෙව්ලොව වෙත යාවි. සෑම කෙනෙකුගේ පියා එකම එක කෙනායි. පාරිශුද්ධකරුයි. ඔහු අපිරිසිදු අයට කියනවා: මා සිහිපත් කිරිම තුළින් ඔබගේ පාප දුරු වී යාවි. ඒ වගේම මා විසින් ස්ථාපනය කරනා සතුටේ ලෝකය වෙතටද ඔබ යාවි. මෙම සටනේ සිටිනා අතර ශිව බාබා සිහිපත් කරනවා නම් ඔබ දෙව් ලොව වෙත යාවි. ඒ සටන් බිම මේකට වඩා වෙනස්. පියා කියනවා: මෙම දැනුම කවදාවත් විනාශ වෙන්නේ නැහැ. සියළු දෙනා ශිව බාබාගේ දරුවන්. දැන් ශිව බාබා කියනවා: මා පමණක් සිහිපත් කිරිමෙන් මුක්ති දේශයේ සිටිනා මා වෙතට ඔබ පැමිණේවි. දැන් උගන්වනා මෙම දැනුම ඉගෙන ගැනිම තුළින් ඔබට දෙව් ලොව අධිරාජ්‍යය හිමිකර ගත හැකි වේවි. එය හරිම පහසුයි එය එක තත්පරයකින් ඔබ දෙව්ලොව මඟ සොයා ගන්නවා. මම නම් වු ජීවය පියා සිහිපත් කරනවා. මෙම සතුටින් සටන් බිමට යන්න. අපි කියා කළ යුතුයි. කෙනෙකුගේ රටක් ආරක්ෂා කර ගැනිමට කළ හැකි සියල්ලම කළ යුතුයි. එහි ඇත්තේ එක් ධර්මයක් පමණයි. එහිදි කිසිම මත ගැටුමක් ඔබට ඇහෙන්නේ නැහැ. මෙහිනම් විවිධාකාර මත රාශියක් තිබෙනවා. මත, භූමිය සම්බන්ධයෙන් ලොකු ලොකු ගැටුම් ඇති වෙනවා. ජල සැපයුම නතර කළ හොත් මිනිස්සු ගල් ගහන්න පටන් ගන්නවා. ධාන්‍ය වර්ග නොලැබුනොත් ආරවුලක්. අපි දැන් අපගේ ස්ව ආධිපත්‍යය රාජ්‍යය ස්ථාපනය කරමින් සිටිනා බව දරුවන් වන ඔබලා දන්නවා. අපි අධිරාජ්‍යය දිනා ගන්නේ මෙම අධ්‍යයනය තුළිනුයි. නව ලෝකයක් අනිවාර්යයෙන්ම ස්ථාපනය විය යුතුයි, එය ස්ථිරයි. ඔබ තුළ විශාල සතුටක් තිබිය යුතුයි. කිසිම දෙයක් සම්බන්දයෙන් රණ්ඩුසරුවල් වීමේ අවශ්‍යතාවයක් නැහැ. අපි ඉතාමත් සරළව ජීවත් විය යුතුයි. ඔබ ඔබගේ නීතිමය ඥාතීන් ලඟට යාමට සිටිනා බව බාබා ඔබට පැහැදිලි කර කියාදි තිබෙනවා. එම නිසා ඔබලා දැන් සිටින්නේ රටින් පිටුවහල් කල තත්වයකයි. සියළු ජීවයන් යාවි. ශරීර ආපසු යන්නේ නැහැ. ශාරිරක අහංකාරය හලා දැමිය යුතුයි. අප ජීව වන අතර අපගේ උපත් 84 දැන් අවසන් වෙමින් යනවා. භාරතය දිව්‍ය ලෝකය වශයෙන් තිබුණු බවත් දැන් එය කලි යුගයක් බවට පත්ව ඇති බවත් භාරතයේ මිනිසුන්ට කියා දෙන්න. කලි යුගයේ ආගම් අසංඛ ගණනක් තිබෙනවා. සත් යුගයේ ඇත්තේ එකම එක ධර්මයක් පමණයි. භාරතය දැන් නැවත වතාවක් දෙව් ලොව බවට පත් වෙනවා. දෙවියන් පැමිණ සිටිනා බව ඇතැම් පුද්ගලයින් අවබෝද කර ගන්නවා. තවත් ඉදිරියට වර්ධනය වන විට ඔවුන් අනාගතය ගැන කියන්න පටන් ගනිවි. ඔවුන් වාතාවර්ණය දකිවි නේද? එම නිසා පියා දරුවන් වන ඔබලාට පැහැදිලි කරනවා. පියා සෑම කෙනෙක්ටම අයිතියි. සෑම කෙනෙක්ටම ඔහු මත අයිතියක් තිබෙනවා. පියා කියනවා: දැන් මම පැමිණ

සිටිනවා. මා පමණක් සිහිපත් කරන්න එවිට ඔබගේ පව් දුරු වී යාවි කියා. මම ඔබ සැම කෙනෙක්ටම කියනවා. දැන් ඕනෑම වෙලාවක යුද්ධයක් ඇති විය හැකි බව මිනිසුන්ට තේරෙනවා. හෙට වුනත් එවන් තත්ත්වයක් උදාවිය හැකියි. හමුදාව එකතුකරන්න යුද්ධයට එතරම් වෙලාවක් යන්නේ නැහැ. කොහොම නමුත් අපගේ අධිරාජ්‍යය තවමත් ස්ථාපනය වී නොමැති බව දරුවන් වන ඔබලාට පැහැදිලියි. එම නිසා දැන් විනාශයක් සිදු විය හැක්කේ කෙසේද? තවමත් ඔබලා පියාගේ පණිවිඩය සතර දිග් භාගයට දීලා නැහැ. පාරිශුද්ධකරු වන පියා කියනවාඃමා සිහිපත් කරන්න. ඔබගේ පාප දුරු වී යාවි. මේ පණිවිඩය සැම කෙනෙකුගේම සවනට වැටිය යුතුයි. යුද්ධය පටන්ගෙන බෝම්බ පිපිරෙන්න පටන්ගත්ත් අපේ අධිරාජ්‍යය අනිවාර්යයෙන්ම ස්ථාපනය වීමට යනවා කියන විශ්වාසය ඔබට තිබෙනවා. ඒ වන තෙක් විණාශය සිදුවන්නේ නැහැ. ලෝකයේ සාමය තිබිය යුතු බව මිනිස්සු කියනවා. ලෝක යුද්ධයක් ඇති වුවහොත් ලෝකයම විනාශ වී යාවි. මෙය ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලයකි. ඔබ මුළු ලෝකයටම දැනුම බෙදා දෙනවා. මුළු ලොක්යම පරිවර්ථනය කරන්නේ එකම එක පියා පමණයි. මෙම දක්‍රය වසර මිලියන ගණනක් පැරණි බව මිනිස්සු කියනවා. එහි වයස අවුරුදු 5000 ක් බව ඔබ දන්නවා. ක්‍රිස්තු තුමා පැමිණීමට වසර 3000 කට පෙර දෙව් ලොවක් තිබුණු බව කියා තිබෙනවා. ඉස්ලාම් හා බෞද්ධ ධර්මයන්ගේ කාලය දැන් ගණන් කරනවා. ඒ ආගම් දෙකට පෙර තිබුණු වෙනත් කිසිම ආගමක් ගැන සඳහන් වී නැහැ. ඔබට දවසින් දවස සියල්ල එළිදරව් කළ හැකයි. එම නිසා ඔබ තවක් තිබිය යුතුයි. ආරවුල් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ආරවුල් ඇති කර ගරන්නේ අනාථයනුයි. දැන් ඔබ දරන ඕනෑම උත්සහයකට ඵලය වසර 21 ක් පුරා ඔබට ලබා ගත හැකියි. රණ්ඩු සරුවල් වුණොත් ඔබට උසස් තත්ත්වයක් දිනා ගත හැකි වෙන්නේ නැහැ. දඬුවම් විඳිමටත් ඔබට සිදු වේවි. මොණදේ වුණත් ඔබට මොන දේ වුවමනා වුණත් පියා ළඟට පැමිණෙන්න. ආණ්ඩුවත් කියනවානීතිය තම අතට ගන්න එපා. ඔබෙන් ඇතැම් අය කියනවා තමන්ට රට සපත්තු දෙකක් ඕනෑ කියලා බාබා කියනවා දරුවනි ඔබ දැන් රටින් නෙරපු තත්ත්වයකයි. එහිදි ඔබට ඉතාමත් හොඳ දේවල් රාශියක් ලැබේවි. පියා ඔබට කියන දේ හරි දේ පමණයි. ඔහු කියාවිමේක හරු නැහැ ඇයි ඒ වගේ දේවල් තව දුරටත් මෙහි බලාපොරොත්තු වන්නේ. මෙහිදි ඔබ ඉතාමත් සරලව ජීවත් විය යුතුයි. නැති නම් ශාරිරික අවධානයට ලක් වේවි. මෙහිදි තම මත අනුගමනය නොකල යුතුයි. බාබා කියනවාලෙඩක් හැදුනොත් වෛද්‍යවරයක කතා කරන්න. බෙහෙත් වලින් සැමට ප්‍රතිකාරෙ කළ හැකියි. කොහොම නමුත් බාබාත් මෙහි ඉන්නවා. මොනවා වුණත් ශ්‍රීමත්, ශ්‍රීමත්මයි, විශ්වාසය ඇති තැන ජය ලැබෙනවා. ඔබට මේ සියල්ලම අවබෝධ වෙනවා. පියාගේ උපදෙස් අනුගමනය කිරිමෙන් යහපතක් සිදු වෙනවා. අපි අපටත් යහපත සලසා ගත යුතුයි. ඔබට තවත් කෙනෙක්ව පවුමක් තරම් වත් වටිනා කෙනෙක් බවට පත් කර වීමට නොහැකි වුනා නම් ඒ කියන්නේ ඔබ තවමත් පැන්සයක් තරම්වත් වටිනා කෙනෙක් බවට පත් වී නැහැ. පවුමක් තරම්වත් වටිනා කෙනෙක් බවට පත්වීමටවත් සුදුසු නැහැ. මෙහිදි ඔබගේ කිසිම වටිනාකමක් නොමැති නම් එහිදීත් ඔබට කිසිම වටිනාකමක් ලැබෙන්නේ නැහැ. සේවයට ලැදි දරුවන් සේවය කිරිමට හරි ආසයි. ඔවුන් සැම තැනම යනවා. සේවය කළේ නැති නම් උපකාරකයෙක් හෝ කරුණාවන්ත කෙනෙක් කියා ඔබට හැඳින් විය නොහැකියි. බාබා සිහිපත් නොකළේ නම් ඔබ අතින් දිගටම කෙරෙන්නේ පිරිහුණු ක්‍රියායි. එමඟින් ඔබගේ තත්ත්වයත් බාලවෙනවා. තමන් කොහොමත් ශිව බාබා එක්ක යෝගා වෙලා ඉන්නවා. කොහොමත් මම බී. කේ. කෙනෙක් කියා දෙයක් නැහැ. ශිව බාබා ඔබට දැනුම දෙන්නේ බ්‍රහ්ම බාබා හරහා පමණයි. ඔබ සිහිපත් කෙරෙන්නේ ශිව බාබා පමණක් නම් කොහොමද මුරලියට ඇහුම්කන් දෙන්නේ. ඒකේ ප්‍රතිඵලය කොයි වගේ වේවිද? හොදට ඉගෙන ගත්තේ නැතිනම් ඔබ ලබනා තත්ත්වය කොයි වගේ වේවිද? සැම කෙනෙකුටම උසස් වාසනාවක් තිබිය නොහැකි බවත් ඔබට තේරෙනවා. එහිදීත් ඔබලාගේ තත්ත්වය ඇත්තේ පිළිවෙලකටයි. සැම කෙනෙක්ම පාරිශුද්ධ විය යුතුයි. පාරිශුද්ධ වීමෙන් තොරොව ජීවයන්ට සාම දේශය වෙතට යාමට නොහැකියි. පියා කියනවාදිගටම මෙම දැනුම සැම කෙනෙක්ටම දෙන්න. කෙනෙක් දැන් මේ දැනුමට ඇහුම්කන් දුන්නේ නැති නම් ඉදිරියේදි අනිවාර්යයෙන්ම අහ ගනිවි. දැන් කොපමණ බාධක දැඩි වේගයකින් පැයා වුණත් ඔබ බිය විය යුතු නැහැ. මන්ද අළුත් ධර්මයක් ස්ථාපනය වෙමිනුයි යන්නේ. ඔබ අදෘශ්‍යමාන රාජ්‍යයක් ස්ථාපනය කරමින් සිටිනවා. සේවයට ලැදි දරුවන් දැකිමට බාබා හරිම කැමතියි. ශ්‍රීමත් අනුගමනය කර ස්වරාජ්‍යයේ තිලකය තමාම පැළඳ ගන්න. මේ සම්බන්ධයෙන් මුරණ්ඩු වන්න එපා. කිසිඳු හේතුවකින් තොරොව තමාට පාඩු සිදු කර ගන්න එපා. පියා කියනවා දරුවනි සේවයට ලැදි කරුණාවන්තයෙක් වන්න. සිසුන් වන ඔබට ගුරුවරයා කියනවා හොඳින් ඉගෙනගෙන ඉදිරියට යන්න. ඔබ උපත් 21 ක දෙව්ලොව ශිෂ්‍යත්වයක් ලබන්නයි යන්නේ මෙම වංශයට යාමම විශාල ශිෂ්‍යත්වයක්. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මෙම සංගම යුගයේදී ඉතාමත් සරලව සාමාන්‍ය ලෙස ජීවත් වන්න. මන්ද මෙය නෙරපු තත්ත්වයේ සිටීමට ඇති කාලයයි. මෙහිදී කිසිඳු බලාපොරොත්තුවක් තබා නොගන්න. කවදාවත් නීතිය තම අතට ගන්න එපා. කවදාවත් රණ්ඩු සරුවල් වෙන්න එපා.
2. විනාශයට පෙර නව රාජ්‍යයක් ස්ථාපනය කරවීමට නම්, සෑම කෙනෙක්ටම පියාගේ පණිවිඩය ලබා දෙන්න පියා කියනවා මා සිහිපත් කරන්න. ඔබගේ පාප දුරු වී යාවි. ඔබ පාරිශුද්ධත්වයට පත්වේවි.

**වරදානය:** ඔබ සෑම විටම කීකරු වී පරම පියාගේ හද සිහසුන මත ඉඳිමින් සාර්ථකත්වයේ තිලකය ලබා ගන්න.

දිනපතා අම්රිත් වේලාවේදී, භාග්‍ය විදාතා පරම පියා තම කීකරු දරුවන් සියලු දෙනාටම සාර්ථකත්වයේ තිලයකය දෙයි. කීකරු බ්‍රහ්මින් දරුවන් හට කතාවට වත් 'අමාරු වැඩක්' හෝ 'අපහසුයි' යන වචන ඔවුන්ගේ සිතිවිල්ලෙන් පවා භාවිත කළ නොහැක. ඔවුන් පහසු යෝගීන් බැවින් කිසිසේත් අධෛර්යමත් නොවන අතර ඔවුන් සෑම විටම හද සිහසුන මත ඉඳිමින් කරුණාබරිත වේ. ඔවුන් ඕනෑම 'මම' යන විඥානය හෝ සැක සහිත හැඟීම් අවසන් කර තිබෙයි.

**පාඨය:** ලෝක පරිවර්තනයේ දිනය ගැන නොසිතා තම තමන්ගේ පරිවර්තනයේ මොහොත නියම කරගන්න.

***** ඕම් ශාන්ති *****